# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1487/32 – 2007 මාර්තු 09 වැනි සිකුරාදා – 2007.03.09

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 8/80.

**1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍ය, මෛත්‍රීපාල සිරිසේන වන මම, 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ඇතිව, මෙහි උපලේඛනයේ දක්වා ඇති ප්‍රදේශ "විශේෂ ප්‍රදේශ" ලෙස එම පනතේ කාර්යයන් සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍ය.

2007 මාර්තු මස 07 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

විශේෂ ප්‍රදේශ I :–

*උතුරට* : වව්නියාව සහ අනුරාධපුර දිස්ත්‍රික් මායිම (උතුරු මැද හා උතුරු පළාත් මායිම) හොරොව්පතාන - වව්නියා මාර්ගයේ (ඒ-29) මධ්‍ය රේඛාව හමුවන ලක්ෂයෙන් ආරම්භව, එම ලක්ෂයේ සිට එම දිස්ත්‍රික් මායිම ඔස්සේ 1988.04.15 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී *ජනරජයේ ගැසට් පත්‍රයේ* ආඥා අංක 6 යටතේ විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති එල් කලාපයේ බටහිර මායිම හමුවන ලක්ෂය දක්වා ඊසාන දෙසට ද, එම ලක්ෂයේ සිට දැනට විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති එල් කලාපයේ බටහිර මායිම ඔස්සේ එට විශේෂ ප්‍රදේශය බටහිර හා දකුණු මායිම හමුවන ලක්ෂය දක්වාද, එම ලක්ෂයේ සිට දැනට විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති එල් කලාපයේ දකුණු මායිම ඔස්සේ එම කලාපයේ නැගෙනහිර මායිම හා දකුණු මායිම හමුවන ලක්ෂය දක්වාද (තැන්නමරම්වාඩි-අවරවියාල් මාර්ගයේ මධ්‍ය ලක්ෂය) එම ලක්ෂයේ සිට තැන්නමරම්වාඩි-අවරවියාල් මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ පුල්මුඩේ නගරයට උතුරින් පිහිටි කලපුවේ උතුරු මායිම එම මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂය දක්වාද, එම ලක්ෂයේ සිට පුල්මුඩෙයි කලපුවෙහි උතුරු මායිම ඔස්සේ මුහුදු සීමාව දක්වාද;

*නැගෙනහිරට* : උතුරු මායිමේ අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට නැගෙනහිරට මුහුදු සීමාව ඔස්සේ යාන්ඔය මුහුදට වැටෙන මෝයකටෙහි මධ්‍ය ලක්ෂය හමුවන ලක්ෂය දක්වා දකුණු දෙසට ද;

*දකුණට :* නැගෙනහිර මායිමේ අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට යාන්ඔයේ මධ්‍ය රේඛාව ඔස්සේ ත්‍රිකුණාමලය - අනුරාධපුර දිස්ත්‍රික් මායිම යාන්ඔයෙහි මධ්‍ය රේඛාව හමුවන ලක්ෂය දක්වා ද, එම ලක්ෂයේ සිට යාන්ඔයේ මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත දෙසට උතුරු මැද සහ නැගෙනහිර පළාත් වෙන්කරන මායිම සහ වාහල්කඩ වැවේ යෝධ ඇළ හමුවන ලක්ෂය දක්වාද, එම ලක්ෂයේ සිට වාහල්කඩ වැවේ යෝධ ඇලේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිරට බරව එම යෝධ ඇලේ ආරම්භක ලක්ෂය හමුවන ලක්ෂය දක්වාද, එම ලක්ෂයේ සිට වාහල්කඩ වැවේ මී. 100 අඩි ආරක්ෂිත කලාපයේ දකුණ හා නැගෙනහිර මායිම හමුවන ලක්ෂය දක්වා සරල රේඛාවක් ඔස්සේ ද, එම ලක්ෂයේ සිට වාහල්කඩ වැවේ මී, 100 අඩි ආරක්ෂිත කලාපයේ මායිම ඔස්සේ දකුණු දෙසට තවලම්හල්මිල්ලෑව ඔයෙහි මධ්‍ය රේඛාව වාහල්කඩ වැවෙහි මීටර් 100 අඩි ආරක්ෂිත කලාප මායිම හමුවන ලක්ෂය දක්වා ද, එම ලක්ෂයේ සිට එම ඔයේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දෙසට එකී ඔය හොරොව්පතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැලිමුවපොතාන ග්‍රාමයේ උතුරු මායිම හමුවන ලක්ෂය දක්වාද, එම ලක්ෂයේ සිට වයඹ දෙසට එකී ග්‍රාම නිලධාරී කොට්ඨාස මායිම ඔස්සේ කැබිතිගොල්ලෑව - හොරොව්පතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම හමුවන ලක්ෂය දක්වාද, එම ලක්ෂයේ සිට එකී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම් ඔස්සේ නිරිත දෙසට කහටගස්දිගිලිය, කැබිතිගොල්ලෑව හා හොරොව්පතාන යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම් තුන එකතුවන ලක්ෂය දක්වාද, එම ලක්ෂයේ සිට කැබිතිගොල්ලෑව කහටගස්දිගිලිය හා රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම් තුන හමුවන ලක්ෂය දක්වා කහටගස්දිගිලිය කැබිතිගොල්ලෑව වෙන් වන මායිම ඔස්සේ බටහිර දිශාවට ද ;

*බටහිර :* දකුණු මායිමේ අවසන්වරට සඳහන් කරන ලක්ෂයේ සිට වයඹ දෙසට රඹෑව, කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම් ඔස්සේ රඹෑව, කැබිතිගොල්ලෑව සහ මැදවච්චිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම් තුන හමුවන ලක්ෂය දක්වාද, එම ලක්ෂයේ සිට වයඹ දෙසට මැදවච්චිය කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙන්වන මායිම ඔස්සේ උතුරු මායිමේ ආරම්භක ලක්ෂය හමුවන ලක්ෂය දක්වා ද වෙයි.

විශේෂ ප්‍රදේශ II :–

*උතුරට :* උතුරු පළාත හා උතුරුමැද පළාත වෙන්වන පළාත් මායිමේ වව්නියා උතුර (දෙමළ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂයෙන් ආරම්භ වී, එම ලක්ෂයේ සිට නැගෙනහිර දෙසට එම පළාත් මායිම් ඔස්සේ දැනට විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති එල් කලාපයේ බටහිර මායිම හමුවන ලක්ෂය දක්වා ද;

*නැගෙනහිරට:* උතුරු මායිමේ අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට දකුණු දෙසට දැනට විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති එල් කලාපයේ බටහිර මායිම ඔස්සේ එම මායිම උතුරු මැද පළාත් මායිම හමුවන ලක්ෂය දක්වා ද;

*බටහිරට:* නැගෙනහිර මායිමේ අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට උතුරුමැද පළාත් මායිම ඔස්සේ බටහිර දෙසට සහ උතුරු දෙසට ආරම්භක ලක්ෂය හමුවන ලක්ෂය දක්වා ද වේ.

විශේෂ ප්‍රදේශ III :–

*උතුරට :* මාන්කුලම් - මුලතිව් (ඒ34) සහ මුලතිව් - පරන්තන් (ඒ 35) මාර්ගයන් හි මධ්‍ය රේඛා හමුවන ලක්ෂයෙන් ආරම්භ වී, එම ලක්ෂයේ සිට බටහිර දෙසට මුලතිව් නගරයේ උතුරින් පිහිටි කලපුවේ දකුණු ඉවුර හමුවන ලක්ෂය දක්වා මුලතිව් පරන්තන් (ඒ35) මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ද, එම ලක්ෂයේ සිට එම කලපුවේ දකුණු ඉවුරු මායිම ඔස්සේ නැගෙනහිර මුහුදු සීමාව හමුවන ලක්ෂය දක්වාද:

*නැගෙනහිරට:* උතුරු මායිමේ අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට දකුණු දෙසට මුහුදු සීමාව ඔස්සේ පුල්මුඩෙයි උතුරු මායිමේ පිහිටි කලපුවෙහි වම් ඉවුර හමුවන ලක්ෂය දක්වා ද;

*දකුණට:* නැගෙනහිර මායිමේ අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට බටහිර දෙසට එම කලපුවේ උතුරු මායිම ඔස්සේ ඉහත සඳහන් කලපුවේ උතුරු මායිම තැන්නමරන්වාඩි - අවරවියාල් මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂය දක්වා ද;

*බටහිරට:* දකුණු මායිමේ අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට දැනට විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති එල් කලාපයේ නැගෙනහිර මායිම ඔස්සේ උතුරු දිසාවට එල් කලාපයේ උතුරු මායිම සහ නැගෙනහිර මායිම හමුවන ලක්ෂය වන තන්තියුත්තු මංසන්ධියේ මධ්‍ය ලක්ෂය දක්වා ද, එම ලක්ෂයේ සිට මාන්කුලම් - මුලතිව් මාර්ගයේ (ඒ 34) මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දෙසට ආරම්භක ලක්ෂය හමුවන ලක්ෂය දක්වා ද වෙයි.

03-715

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.